74

# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுறுபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. } ED/02/29/02/02/18 | ඔබේ අංකය / உமது இல. / Your Ref. } | දිනය / திகதி / Date } 2019.03.06

Information & Communication Technology Branch
10 JAN 2019
Ministry of Education "Isurupaya", Battaramulla.

චක්‍රලේඛ අංක: 09/2019

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**<u>ශ්‍රී ලංකා ගුරු සේවයේ අන්තර්ග්‍රහණය, උසස්වීම් හා වැටුප් සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා වන පොදු උපදෙස් සංග්‍රහය</u>**

අංක 1885/38 හා 2014.10.23 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද, 2008.07.01 දින සිට ක්‍රියාත්මක වූ නව ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අන්තර්ග්‍රහණය, උසස්වීම් හා ඊට අදාළ වැටුප් සංශෝධන වලදී සහ 1994.10.06 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන හා ඊට අදාළව වරින්වර නිකුත් වී ඇති සංශෝධිත චක්‍රලේඛ අනුව ක්‍රියා කිරීමේදී විවිධ ගැටළු හා විෂමතා පැන නැගී ඇති බව පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් මෙන්ම ගුරු වෘත්තීය සංගම් විසින් යොමු කර ඇති ලිපි හා ඉල්ලීම් මගින් පෙනී ගොස් ඇත. ඒ අනුව එවැනි කරුණු වලට පැහැදිලි කිරීම් ලබා දීමට තීරණය කර ඇති අතර, ගුරුභවතුන්ගේ දැනට පැනනැගී ඇති සේවා ගැටළු නිරාකරණය කිරීම සඳහා පහත දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස දන්වමි.

**02. 1994.10.06 සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුරු සේවයේ අන්තර්ග්‍රහණ හා උසස්වීම් පිළිබඳ විධිවිධාන;**

2.1 1995.04.03 දිනැති අංක 865/3 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කර, 1997.03.11 දිනැති අංක 966/5 සහ 1997.05.14 දිනැති අංක 975/6 දරණ අති විශේෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුරු සේවය (ශ්‍රී ලං.ගු.සේ.),

- 3 වන පන්තියේ II ශ්‍රේණිය
- 3 වන පන්තියේ I ශ්‍රේණිය
- 2 වන පන්තියේ II ශ්‍රේණිය
- 2 වන පන්තියේ I ශ්‍රේණිය
- 1 පන්තිය

වශයෙන් වන ශ්‍රේණි ව්‍යුහයකින් යුක්ත ව 1994.10.06 දින සිට ක්‍රියාත්මක වූ අතර, අංක 95/7 හා අංක 97/5 දරණ අධ්‍යාපන චක්‍රලේඛ හා වරින්වර නිකුත් වූ සංශෝධිත චක්‍රලේඛ විධිවිධාන මගින්, 1995.01.01 දින සිට ඊට අදාළ වැටුප් හිමි සේ සලකා ක්‍රියාත්මක විය.

2.2 1994.10.06 දින සිට, එදින ට සේවයේ යෙදී සිටි සියලුම ගුරුභවතුන් ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ යුතුය. අන්තර්ග්‍රහණයේදී වැටුප් වැඩි වීමේ දිනය වෙනස් නොවන අතර, එදිනට උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීම මත වැටුප් වර්ධක දිනය, ඔක්තෝම්බර් 06 ලෙස හා ඉන්පසු වැටුප් වර්ධක දිනය, උසස්වීම් දිනය ලෙස ද සැලකිය යුතුය. 1995.01.01 දින අන්තර්ග්‍රහණයට අදාළ වැටුප් ගෙවීම ක්‍රියාත්මක වූ දිනය පමණක් බවද සැලකිය යුතුයි.

2.3 ශ්‍රී ලංකා ගුරු සේවයට අදාළ අන්තර්ග්‍රහණ හා උසස් වීමේ විධිවිධාන,

2.3.1 අ.සේ.ක./ගුරු සේවා චක්‍රලේඛ අංක 1/99, 1/99(1) හා අධ්‍යාපන චක්‍රලේඛ අංක 2000/14 මගින් 1999.09.01 දින සිට හෝ එදිනට පසු උසස්වීම් සඳහා උසස්වීම් දින සිට ගෙවීමේ පදනම මත 2000.12.31 දින දක්වා ද,

2.3.2 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2004/01 මගින් උසස්වීම් දින සිට හිඟ වැටුප් හිමි සේ සලකා 2001.01.01 දින සිට 2003.12.31 දින දක්වා ද,

2.3.3 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2005/04 මගින් 2005.01.01 දින සිට හිඟ වැටුප් හිමි සේ සලකා 2004.01.01 දින සිට 2005.01.01 දින දක්වා ද,

2.3.4 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2009/25 මගින් උසස්වීම් දින සිට හිඟ වැටුප් හිමි සේ සලකා 2005.01.02 දින සිට 2008.12.31 දින දක්වා ද,

2.3.5 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2011/30 මගින් උසස්වීම් දින සිට හිඟ වැටුප් හිමි සේ සලකා 2009.01.01 දින සිට 2010.12.31 දින දක්වා ද,

වරින්වර සංශෝධනය වී ඇත.

2.4 1994.10.06 දින සිට 2010.12.31 දින දක්වා ලකුණු මත පමණක් ගුරු සේවයේ උසස්වීම ලබා දීමට ක්‍රියාත්මක වූ විධිවිධාන අනුව ශ්‍රී ලං.ගු.සේ. උසස් වීම සඳහා,

2.4.1 නුපුහුණු සේවා කාලය වසර දෙක (02) ට ලකුණු එක (01) ක් හා ශේෂ කාලය වසර එකක් (01) ක් හෝ ඊට වැඩි වන විට අමතර ලකුණු 01 ක් ද,

2.4.2 පුහුණු හෝ උපාධි සේවා කාලය වසර එක (01) ට ලකුණු එක (01) ක් බැගින් හා ශේෂ කාලය මාස හය (06) ක් හෝ ඊට වැඩි නම් අමතර ලකුණු 01 ක් ද,

2.4.3 පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සමත්වීම වෙනුවෙන් ද්විගුණනය නොවන පරිදි ලකුණු 01 ක් ද,

ලෙස ලකුණු ලබා දීම ක්‍රියාත්මක විය යුතුය.

2.5 අංක ED/02/29/04/07/01 හා 2006.03.21 දිනැති "2005/04 චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන පොදු උපදෙස් සංග්‍රහය" මගින්, පුහුණු හෝ උපාධි සේවා කාලයේ වසරට වැඩි සේවා කාලය මාස 06 ක් හෝ ඊට වැඩි වන විට අමතර ලකුණු 01 ක් ලබා දීම වෙනුවට, පුහුණු ගුරුභවතෙකු උපාධිය ලබා ගැනීමේදී හෝ උපාධි ගුරුභවතෙකු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ලබා ගැනීමේදී ශේෂ කාලය මාස 06 ක් හෝ ඊට වැඩි නම් අමතර ලකුණු 01 ක් ලබා දීම ක්‍රියාත්මක විය.

2.6 1994.10.06 දින සිට ගුරු සේවය ක්‍රියාත්මක වීමෙන් පසු, සේවයේ සිටිය දී, උපාධිය සමත්වීම මත,

2.6.1 රා.සේ.කො./අ.සේ.ක. චක්‍රලේඛ අංක 96/02 හි විධිවිධාන අනුව උපාධිය ලබා වසරක් ගත වන දින සිට උපාධියට පරිවර්තනය කිරීම ක්‍රියාත්මක වූ අතර,

2.6.2 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2005/04 විධිවිධාන අනුව, 2005.01.01 දින සිට හිඟ වැටුප් හිමි සේ සලකා ස්ථිර පත්වීමක් ලබන විට උපාධිය ලබා තිබුණේ නම්, පත්වීම් දින සිට ද, සේවයේ යෙදී සිටිය දී, උපාධිය සමත්ව පසු දිනක සිට උපාධියට පරිවර්තනය කර ඇති විට, උපාධිය වලංගු දින සිටද,

උපාධි පත්වීමක් ඇති සේ සලකා, ගුරු සේවයේ අන්තර්ග්‍රහණය හා උසස්වීම් වලදී ක්‍රියා කළ යුතුය.

2.6.3 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2009/27 මගින් උපාධි සහතිකය වලංගු වන දින සිට උපාධිධාරී ගුරු පත්වීම ලබා දීමට ද විධිවිධාන සැලසී ඇත.

2.7 අංක 2005/04 දරණ අධ්‍යාපන චක්‍රලේඛයේ 02 (i), (ii) ඡේද වල විධිවිධාන අනුව මුල් පත්වීමේ වැඩ භාරගෙන ඇති දින සිට ස්ථිර පත්වීම හිමි වේ පලකා සියලුම වර්ගවල අභ්‍යාසලාභී හා ආධුනික ගුරුභවතුන් වෙත අංක 2005/04 පොදු උපදෙස් සංග්‍රහයේ 1.1.2 ඡේදයේ දක්වා ඇති පරිදි අදාළ ආකෘතියේ වූ අයදුම්පත් ගෙන්වා ගෙන නියමිත බලධාරියා (පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්/ පළාත් අධ්‍යාපන ලේකම්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ) වෙත යවා ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත විධිමත් පත්වීම් ලිපි ලබා දීමේ කටයුතු අප්‍රමාදව අවසන් කළ යුතුය. එලෙස විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීමේදී බඳවා ගැනීමේ නිවේදනයෙහි සඳහන් පත්වීමට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව සනාථ කර ගත යුතුය.

2.8 ඉහත 1.1 ඡේදයෙන් දක්වා ඇති පරිදි 2010.12.31 දින දක්වා ක්‍රියාත්මක වූ මුල් ගුරු සේවා ව්‍යවස්ථා විධිවිධාන යටතේ උපාධිධාරී ගුරුභවතෙකු ඊළඟ ශ්‍රේණියට උසස් වීමට නියමිත සේවා කාලය තුළ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් ලැබූ දිනයේ සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ 2–II ශ්‍රේණියට පත් කිරීම ක්‍රියාත්මක වූ අතර, සේවයේ ඊළඟ උසස්වීම් වලදී පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම වෙනුවෙන් නියමිත අමතර ලකුණු 01 ක් ලබා දී තිබිය යුතුය.

3 2008.07.01 සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුරු සේවයේ අන්තර්ග්‍රහණය හා උපස්ථිති විධිවිධාන;

3.1 අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කර, 2008.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව යටතේ,

3.1.1 2008.07.01 දිනට සේවයේ යෙදී සිටි ස්ථිර ගුරු පත්වීම් දැරූ ගුරුභවතුන් (ආධුනික/අභ්‍යාසලාභී/ගුරු සහායක හැර) එදිනට සිටි ශ්‍රේණිය/පන්තිය හා ඊට අදාළ සුදුසුකම් මත 2008.07.01 දින සිට අන්තර්ග්‍රහණය කළ යුතු පන්තිය/ශ්‍රේණිය ගුරු සේවා ව්‍යවස්ථාවේ 14 ඡේදය යටතේ සිදු කළ යුතුය.

3.1.2 ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණිධාරීන් 3-II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමේදී බඳවා ගැනීමේ ගැසට් නිවේදනය මගින් නියම කර ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

3.1.3 අන්තර්ග්‍රහණයට අදාළ වැටුප් සංශෝධනය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(XII) උපලේඛන II හි විධිවිධාන අනුව නිකුත් කළ අධ්‍යාපන චක්‍රලේඛ අංක 35/2014 (04.06.07.08 ඡේද හැර) සහ අධ්‍යාපන චක්‍රලේඛ අංක 35/2014(I) හි දක්වා ඇති විධිවිධාන අනුව නිශ්චිත වැටුප් වර්ග හඳුනාගෙන, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2010 න් සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) යටතේ 2008.06.30 දිනට ලැබූ වැටුප් පියවර අනුව, පියවරෙන් පියවර ක්‍රමයට ක්‍රියාත්මක කළ යුතු අතර, ඊට අදාළ හිඟ වැටුප් ගෙවීම 2011.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

3.2 1994.10.06 දින සිට 2008.06.30 දින දක්වා ක්‍රියාත්මක වූ විවිධ වැටුප් සංශෝධන, එනම් රා.පරි.චක්‍ර. අංක 2/97(III) (1997.01.01 සිට) රා.පරි.චක්‍ර. අංක 15/2003 (2004.01.01 සිට) රා.පරි.චක්‍ර. අංක 09/2004 (2004.12.01 සිට) රා.පරි.චක්‍ර. අංක 06/2006 (2006.01.01 සිට) රා.පරි.චක්‍ර. අංක 06/2006(IV) (2007.06.01 සිට) රා.පරි.චක්‍ර. අංක 28/2010 (2007.06.01 සිට) වැටුප් සංශෝධන අදාල පරිදි, 2008.06.30 දක්වා නිවැරදිව සිදුවී තිබිය යුතු අතර, රා.පරි.චක්‍ර. අංක 28/2010න් සංශෝධිත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(IV) යටතේ 2008.06.30 දිනට ලැබූ වැටුප් පියවර පදනම් කර ගනිමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(XII) උපලේඛන II හි ඒ ඒ ශ්‍රේණියට අදාළ යෝජිත පියවර තීරුවෙහි සඳහන් අනුරූපී වැටුප් පියවරෙහි පිහිටුවීම, ශ්‍රී ලංකා ගුරු සේවයේ අන්තර්ග්‍රහණය මත වැටුප් සංශෝධනය පැවති සේවා ව්‍යවස්ථා විධිවිධාන වලට අගතියක් නොවන ලෙස කඩිනමින් සිදු කිරීමට වගබලා යුතුය.

3.3 අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7:2:6 ඡේදයේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ ශ්‍රේණියක සිට තවත් ශ්‍රේණියකට පත් කිරීම, පහත සඳහන් පරිදි තවදුරටත් ක්‍රියාත්මක කළ යුතුය.

3.3.1 සේවයේ 3-II හෝ 3-I(ඇ) ශ්‍රේණිධාරියෙකු ගුරු පුහුණුව සම්පූර්ණ කළ විට 3-I(ආ) ශ්‍රේණියට හා උපාධි සුදුසුකම් ලබා ගත් විට 3-I(අ) ශ්‍රේණියට පත් කිරීම.

3.3.2 සේවයේ 3-II හෝ 3-I(ඇ) ශ්‍රේණිධාරියෙකු අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම් ලබා ගත් විට 2-II ශ්‍රේණියට පත් කිරීම.

3.3.3 සේවයේ 3-I(ආ) ශ්‍රේණිධාරියෙකු ශ්‍රේණියේ සේවා කාලය වසර පහක් තුළ උපාධිය හෝ අධ්‍යාපනවේදී උපාධිය ලබා ගත් විට හා 3-I(අ) ශ්‍රේණිධාරියෙකු ශ්‍රේණියේ සේවා කාලය වසර තුනක් තුළ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම සම්පූර්ණ කළ විට 2-II ශ්‍රේණියට පත් කිරීම.

3.3.4 අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම මත පත්වීමක් ලැබීමේදී හෝ උපාධි පත්වීමක් ලබන විට පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම සම්පූර්ණ කර ඇත්නම්, පත්වීමේ වැඩ භාරගත් දින සිට 2-II ශ්‍රේණියට පත් කිරීම.

මීට අදාළ වැටුප් පරිවර්තන ආයතන සංග්‍රහයේ VII: 5 විධිවිධාන යටතේ සිදුවිය යුතුයි.

3.4 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 15 ඡේදයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක පීඑස්සී/ ඊඑස්ටී/7/2/1(ii)/2012 හා 2018.03.28 දින දරණ අනුමැතිය අනුව සේවයේ උසස්වීම් පිළිබඳ අන්තර්කාලීන විධිවිධාන 2019.10.23 දින දක්වා දීර්ඝ කිරීම මත ගුරු සේවා ව්‍යවස්ථාවේ 08 වෙනි ඡේදයේ සඳහන් ඒ ඒ ශ්‍රේණියට/ පන්තියට අදාළව සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවෙන් 2019.10.22 දින දක්වා නිදහස් කර ඇත. ඒ අනුව එදින දක්වා අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර/ නිදහස් කර ඇත්නම් කාර්යක්ෂමතා කඩඉමෙන් ද, නිදහස් ලේ සලකා උසස්වීම් ලබා දිය යුතුය. ඉන්පසු ගුරු සේවයේ සියලුම ශ්‍රේණි/ පන්ති වලට අදාළ උසස්වීම් සඳහා සේවා ව්‍යවස්ථාවේ සඳහන් අනෙකුත් අවශ්‍යතාවයන්ට අමතරව ගුරු සේවා ව්‍යවස්ථාවේ 08 ඡේදයේ දැක්වෙන පරිදි ඒ ඒ ශ්‍රේණි/ පන්ති වලට අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් එහි සඳහන් කාලය තුළ සමත් වී තිබිය යුතුය. එසේ උසස්වීම් ලබා දීමේ දී කාර්යක්ෂමතා කඩඉම් සමත් බවට ලබා දී ඇති සහතිකයේ වලංගු දිනය ගැනද සැලකිලිමත් වෙමින් ක්‍රියා කළ යුතුය.

3.5 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 13:15 හි දැක්වෙන පරිදි ගුරු සේවයේ අන්තර්ග්‍රහණය හා උසස්වීම් වලට අදාළ අධ්‍යාපන පශ්චාත් උපාධි ලෙස, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් පිරිනමනු ලබන අධ්‍යාපන පශ්චාත් උපාධි පිළිගැනෙන අතර ඒ අනුව අධ්‍යාපන දර්ශනපති උපාධිය, අධ්‍යාපනපති උපාධිය, ශාස්ත්‍රපති (අධ්‍යාපන) හා අධ්‍යාපන විද්‍යාපති උපාධියද, අධ්‍යාපන පශ්චාත් උපාධි ලෙස පිළිගෙන ඇත. අංක 2005/04 පොදු උපදෙස් සංග්‍රහයේ 2:2:3 ඡේදය මඟින් ද මෙය සනාථ කර ඇත. ගුරු සේවයේ ව්‍යවස්ථා විධිවිධාන අනුව අන්තර්ග්‍රහණයේදී, උසස්වීම් හා පත් කිරීම් වලදී අදාළ කර ගන්නා සියලුම අධ්‍යාපන සහතික (උදා: අධ්‍යාපන පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව) අදාළ ආයතන වලින් සනාථ කරවා ගැනීමෙන් පසු පමණක් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

3.6 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 15 ඡේදයේ විධිවිධාන අනුව, හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක පීඑස්සී/ ඊඑස්ටී/7/2/1(ii)/2012 හා 2018.03.28 දින දරණ අනුමැතිය අනුව, සේවයේ උසස්වීම් පිළිබඳ අන්තර්කාලීන විධිවිධාන 2019.10.23 දින දක්වා දීර්ඝ කිරීම මත ගුරුසේවා ව්‍යවස්ථාවේ 11.2.3 ඡේදයේ සඳහන් ඒ ඒ ශ්‍රේණියට/ පන්තියට අදාළ වූ සම්පූර්ණ කළයුතු වෘත්තීය සමාලෝචන අවශ්‍යතාවෙන් 2019.10.22 දින දක්වා නිදහස් කර ඇත.

ඒ අනුව එදින දක්වා අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර/ නිදහස් කර ඇත්නම්, වෘත්තිය සමාලෝචන අවශ්‍යතාවෙන් ද, නිදහස් ලෙස සලකා උසස්වීම ලබා දිය යුතුය. ඉන්පසු ගුරු සේවයේ සියලුම ශ්‍රේණි/ පන්ති වලට අදාළ උසස්වීම් සඳහා අනෙකුත් අවශ්‍යතාවන්ට අමතරව උසස්වීමට නියමිත සේවා කාලය තුළ වෘත්තීය සමාලෝචන අවශ්‍යතාව සම්පූර්ණ කර තිබිය යුතුය.

ගුරු සේවා ව්‍යවස්ථාවේ 13:6 හි දැක්වෙන පරිදි අධීක්ෂණ මණ්ඩලය විසින් වෘත්තීය සමාලෝචනයෙන් පසු "ඉතා හොඳයි/ හොඳයි/ සතුටුදායකයි/ අසතුටුදායකයි" යන වර්ගීකරණය යටතේ නිකුත් කළ සහතිකයක් උසස්වීම් අයදුම්පත සමඟ ඉදිරිපත් කර තිබිය යුතුය. අධීක්ෂණ මණ්ඩලයේ වර්ගීකරණය "අසතුටුදායකයි" නම් උසස්වීමට සුදුසුකම් ලැබීම සඳහා නැවත වෘත්තීය සමාලෝචනයට භාජනය විය යුතුය.

3.7 අංක 2005/04 දරණ අධ්‍යාපන චක්‍රලේඛය මගින් 1994.10.06 දිනට පෙර දෑ අවුරුදු හෝ තුන් අවුරුදු ඩිප්ලෝමා සුදුසුකම් මත රජයේ පාසලක පත්වීම ලැබූ හා 1994.10.06 දිනට පෙර බඳවා ගැනීමේ ගැසට් නිවේදනය නිකුත් කර පසුව බඳවා ගෙන ඇති, එම සුදුසුකම් සහිත පුහුණුව රහිත ගුරුභවතුන්ද (අංක 2005/04 පොදු උපදෙස් සංග්‍රහයේ 02 (IV)ඡේදය අනුව) පුහුණු ගුරුවරුන් ලෙස සලකා අන්තර්ග්‍රහණය කිරීමට හා එම කාලය උසස්වීම සඳහා පුහුණු ගුරු සේවා කාලයක් ලෙස සලකා ක්‍රියා කිරීමටද, 2005.01.01 දින සිට හිඟ වැටුප් හිමි ලෙස සලකා වැටුප් සංශෝධනය කිරීමටද, විධිවිධාන සැලසිණි. 2008.07.01 දින සිට ක්‍රියාත්මක ගුරු සේවා ව්‍යවස්ථා විධිවිධාන යටතේද, එම ගුරුභවතුන්, පුහුණු ගුරුවරුන් ලෙස සලකා අන්තර්ග්‍රහණය හා වැටුප් සංශෝධනය සහ උසස්වීම් ලබා දීමට ක්‍රියා කළ යුතුය.

3.8 මොඩියුල මගින් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීමේ කටයුතු ගුරු මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කළ යුතුය. ඒ අනුව මොඩියුල වැඩසටහන් වලට ගුරුභවතුන් කැඳවීම සඳහා ප්‍රමුඛතාව හඳුනාගනිමින් අවශ්‍ය තොරතුරු සැපයීම හා පළමුවැනි, දෙවැනි හා තුන්වැනි කාර්යක්ෂමතා කඩඉම සඳහා වන මොඩියුල අඛණ්ඩව හා අප්‍රමාදව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පිළිබඳ නිරන්තරව සොයා බලා ක්‍රියා කරන ලෙස මෙයින් අවධාරණය කෙරේ.

3.9 ගුරු සේවයේ ඒ ඒ ශ්‍රේණි හෝ පංති වලදී සේවා ව්‍යවස්ථාවේ (08) වැනි ඡේදයේ විධිවිධාන අනුව එහි සඳහන් නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම සමත්ව නැති විට සේවා ව්‍යවස්ථාවේ 10:3:4:1:2 සටහන 9 අනුව නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන ගුරුභවතුන්ගේ උසස්වීම් දිනය, කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු අතර, ඒ පිළිබඳව කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ X වැනි පරිච්ඡේදයේ විධිවිධාන අනුව ද, ක්‍රියා කළ යුතුය.

3.10 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(XII) උපලේඛන II හි වැටුප් වගු 2008.07.01 දින සිට ක්‍රියාත්මක අන්තර්ග්‍රහණයට පමණක් සීමා වේ. 2008.07.01 දින හෝ ඉන්පසු ගුරු සේවයේ පත්වීම් හා උසස්වීම් වලදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(XII) උපලේඛන I හි වැටුප් පරිමාණ හා වැටුප් වගු පමණක් යොදා ගත යුතු අතර, වැටුප් පියවර තීරණය කිරීමේ දී, ඊළඟ ශ්‍රේණියට උසස් නොවූයේ නම් තීරුව යටතේ දැක්වෙන වැටුප් පියවර සුදුසු අවස්ථා වලදී අදාළ කර ගත යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(V) අනුව 2006.01.01 දිනෙන් පසු වැටුප් පරිමාණයක උපරිමය ඉක්මවා වැටුප් වර්ධක හිමි ලෙස සැලකෙන්නේ ඕනෑම තනතුරු වර්ගයක උසස්වීම් ශ්‍රේණි වල ඉහළම ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරෙන් ඔබ්බට පමණක් බව සැලකිය යුතුය.

3.11 උපාධිධාරී ගුරුභවතුන්ගේ වෘත්තීය සුදුසුකම් ලෙස, ගුරු පුහුණුව (උපාධියට පෙර හෝ පසු) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ අධ්‍යාපනවේදී උපාධිය පිළිගෙන ඇති ලෙස සලකා ක්‍රියා කළ යුතුය. සේවයේ සිටියදී උපාධිය මත පත්වීම පරිවර්තනය කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගත් උපාධි පමණක් පිළිගැනෙන අතර, මුල් පත්වීමට අදාළ විෂය සහිත උපාධියක් වීම අනිවාර්යය නොවේ.

3.12 ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියේ සිට 2-I ශ්‍රේණිය දක්වා වන උසස්වීම් වලදී, පත්වීම ස්ථිර කර තිබීම, අදාළ කාලය තුළ (වසර 09, 07 හෝ 05) සියලු වැටුප් වර්ධක උපයා ගෙන තිබීම හා දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම ද, 2-I ශ්‍රේණියේ සිට I පන්තිය දක්වා වන උසස්වීම් වලදී, පත්වීම ස්ථිර කර තිබීම, තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම, වසර 06 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම පිළිබඳව සැලකිලිමත්වීමේ අවශ්‍යතාව හා එම අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට ක්‍රියා කළ යුතු බව විදුහල්පතිවරුන් මඟින් ගුරුභවතුන් දැනුවත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

3.13 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2005/04 හා අධ්‍යාපන චක්‍රලේඛ අංක 2008/45 විධිවිධාන යටතේ සොයෙන අන්තර්ග්‍රහණ හෝ උසස්වීම් වලට අදාළ පියවර වැටුප් සංශෝධන වලදී, 2005.01.01 දින සිට හිඟ වැටුප් හිමි සේ සලකා ක්‍රියා කළ යුතුය. 2008.07.01 දින හෝ ඉන්පසු අන්තර්ග්‍රහණය යටතේ වූ වැටුප් පියවර මත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(XII) උපලේඛන I හි ඒ.ඒ ශ්‍රේණියට/ පන්තියට නියමිත වැටුප් පියවර පාදක කර ගනිමින් 2011.01.01 දින සිට (උසස්වීම ඉන්පසු දිනක නම් උසස්වීම් දින සිට) හිඟ වැටුප් හිමි සේ සලකා උසස්වීමේ වැටුප් පරිවර්තනය කළ යුතුය.

3.14 1999.12.31 දින හෝ ඊට පෙර දිනයක සිට ක්‍රියාත්මක උසස්වීම් සඳහා ආයතන සංග්‍රහයේ VII:5 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/94 විධිවිධාන අදාළ කර ගනිමින් මුල් වැටුප් වර්ධක දිනය හා උසස්වීම් දිනය දෙකක් වන විට වැටුප් වර්ධක දිනයේ සිට උසස්වීම් දිනය දක්වා උපයාගත් වැටුප් වර්ධක අගය, උසස්වීම් දිනට ලැබූ වැටුප් පියවරට එකතු කර උසස්වීමේ වැටුප් පරිවර්තනය සඳහා පාදක කර ගත යුතුය.

3.15 2000.01.01 දින හෝ ඉන්පසු දිනයක සිට ක්‍රියාත්මක උසස්වීම් සඳහා උසස්වීමේ වැටුප් පරිවර්තනයකදී, මුල් වැටුප් වර්ධක දිනය හා උසස්වීම් දිනය දෙකක් වන විට ආයතන සංග්‍රහයේ VII:5:3 අනුව වැටුප් වර්ධක දිනයේ සිට උසස්වීම් දිනය දක්වා උපයාගත් එකී වැටුප් වර්ධක අගය මත ගණනය කළ උපයා ගත් වැටුප් වර්ධක අගයට සමාන මුදල ගෙවිය හැකි වන පරිදි, වැටුප් පරිවර්තන ලිපියේ දැක්විය යුතු අතර, එසේ උපයාගත් වැටුප් වර්ධක අගය සැලකිල්ලට නොගෙන, උසස්වීම් දිනය වන විට ලබමින් සිටි වැටුප් පියවර පාදක කර ගනිමින් උසස්වීමේ වැටුප් පරිවර්තනය කළ යුතුය.

3.16 නව ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වූ 2008.07.01 දිනෙන් පසු ඊළඟ ශ්‍රේණියට/ පන්තියට උසස්වීම් ලබා දීමේදී නව විධිවිධාන යටතේ උසස්වීම සඳහා අවශ්‍ය සේවා කාලය ගණනය කළ යුත්තේ වර්තමාන ශ්‍රේණියට/ පන්තියට සත්‍ය වශයෙන් පත් වී/ උසස් වී ඇති දිනය පාදක කර ගනිමිනි.
උදා: 2007.01.01 දින සිට 2-I ශ්‍රේණියට උසස් වූවෙකු, එදින සිට වසර හය (06) කින් 1 පන්තියට උසස්වීම සඳහා අවශ්‍ය සේවා කාලය 2013.01.01 දිනට සපුරා ඇති සේ සැලකිය යුතුය.

3.17 2008.07.01 දින සිට 2010.12.31 දින දක්වා කාලය තුළ විශ්‍රාම ලබා ඇති ගුරුභවතුන්ගේ අන්තර්ග්‍රහණය හා වැටුප් සංශෝධනය, කල්පිත පදනම මත වැටුප් පරිවර්තනය කර, ඒ අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය කර සංශෝධිත විශ්‍රාම වැටුප් 2011.01.01 දින සිට ගෙවීමට සැලැස්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු අතර, 2011.01.01 දිනට පසු ගුරු සේවා ව්‍යවස්ථාව නිකුත් කළ දිනය දක්වා විශ්‍රාම ගොස් ඇති ගුරුභවතුන් පිළිබඳව ද ඒ අනුව ක්‍රියා කර සංශෝධිත විශ්‍රාම වැටුප විශ්‍රාම ලද දිනයේ සිට ගෙවීමට සැලැස්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.

3.18 ගුරු සේවයේ උසස්වීම් අයදුම්පත් වල වැටුප් වර්ධක උපයා ගැනීම 09 ක් දක්වා දැක්වීම හා කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ විස්තර යටතේ "කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම වලංගු දිනය" ද ඇතුළත් කළ යුතු අතර, වෘත්තීය සමාලෝචන ඇගයීම පිළිබඳ අධීක්ෂණ කමිටුවේ නිගමනය (ඉතා හොඳයි/ හොඳයි/ සතුටුදායකය/ අසතුටුදායකය) දැක්වෙන සහතික පිටපත ඉදිරිපත් කරන බවට වූ වගන්ති ද, අයදුම්පතේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වාර්තාවෙහි නියමිත වැටුප් වර්ධක සංඛ්‍යාව උපයා ගෙන ඇති බවට වගන්ති ද ඇතුළත් කළ යුතුය.

3.19 අධ්‍යාපන චක්‍රලේඛ අංක 2008/45 අනුව 1994.10.06 දිනට පෙර පත් වූ වෘත්තීය සුදුසුකම් සහිත හා රහිත උපාධිධාරී ගුරුභවතුන් පිළිබඳව අන්තර්ග්‍රහණයේදී, අංක 975/6 හා 1997.05.14 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය හා අධ්‍යාපන චක්‍රලේඛ අංක 97/5 විධි විධාන අනුව, 1994.10.06 දිනට උපයාගත් ලකුණු අනුව අදාළ ශ්‍රේණියේ නියමිත වැටුප් පියවර හා ශේෂ කාලයක් ඇත්නම් ඊළඟ වැටුප් පියවර (අංක ගුරුසේ/ස්ථා/කමි/1 හා 1997.08.14 සහ අංක ඊඩී/2/29/10/20/49/රස් හා 2010.04.01 දිනැති චක්‍රලේඛ ලිපි අනුව) හිමි සේ සලකා, ඊළඟ ශ්‍රේණියට/ පන්තියට උසස් වීමට අවශ්‍ය ඉතිරි ලකුණු උපයාගත් දින සිට උසස්වීම හිමි සේ සලකා ක්‍රියා කළ යුතුය. නව ගුරු සේවා ව්‍යවස්ථා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ද, එම වර්ගයට අයත් ගුරුභවතුන් උපාධිය හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම මත ශ්‍රී ලං.ගු.සේ. 2–II ශ්‍රේණියට පත් වූ සේ සලකා අන්තර්ග්‍රහණයේදී හා උසස්වීම් වලදී, ක්‍රියා කළ යුතුය. ඊට අදාල වැටුප් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(XII) හි 10 වන තීරය යටතේ සකස් කළ යුතුය.

3.20 1994.10.06 දින සිට ක්‍රියාත්මක වූ විධි විධාන යටතේ 2010.12.31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක කළ යුතුව තිබූ, එහෙත් ක්‍රියාත්මක වී නොමැති ගුරු සේවයේ උසස්වීම, එම විධි විධාන වලට අනුකූලව ප්‍රථමයෙන් ක්‍රියාත්මක කළ යුතු අතර, එම කාලයට අදාළ නව ව්‍යවස්ථා විධි විධාන යටතේ වූ උසස්වීම් ඉන්පසු ක්‍රියාත්මක කළ යුතුය.

3.21 ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 5:1:1:2 සටහන 1 හා අධ්‍යාපන චක්‍රලේඛ අංක 35/2014(I) හි 7 ඡේදයේ විධිවිධාන ද අනුව 2008.07.01 දිනට සේවයේ සිටින ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ගේ වැටුප අධ්‍යාපන චක්‍රලේඛ අංක 35/2014(I) හි 4–II(ආ) ඡේදයේ විධිවිධාන අනුව ප්‍රථමයෙන් පරිවර්තනය කළ යුතු අතර, 2014.12.31 දින වන විට ද ගුරු සේවයේ 3-I(ආ) ශ්‍රේණියේ සිටින ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ගේ වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(XII) උපලේඛන II හි 6 තීරයෙහි සඳහන් යෝජිත වැටුප් පියවර යටතේ 3 වන පියවර වන රු.15,000/- වැටුප් පියවර ආරම්භක වැටුප් පියවර සේ සලකා පියවරෙන් පියවර ක්‍රමයට නැවත පරිවර්තනය කර, 2015.01.01 දිනට හිමි වැටුප් පියවරේ හි පිහිටුවිය යුතුය. ( උදා : 2012.06.01 දින ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පත්වීමක් ලැබූවෙකු එදිනට රු.15,000/- වැටුප් පියවර කල්පිතව ලැබූ සේ සලකා, 2015.01.01 දින සිට රු.15,360/- පියවරෙහි පිහිටුවීම) 2015.01.01 දින සහ ඉන්පසු ගුරු සේවයේ 3-I(ආ) ශ්‍රේණියට බඳවා ගැනීමේදී ආරම්භක වැටුප් පියවර රු.15,000/- ලෙස සලකා ක්‍රියා කළ යුතුවේ .

3.22 ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II හා 3-I(ඇ) ශ්‍රේණිධාරීන්ට ගුරු පුහුණුව මත 3-I(ආ) ශ්‍රේණියට හෝ උපාධිය මත 3-I(අ) ශ්‍රේණියට හෝ අධ්‍යාපනවේදී උපාධිය මත 2-II ශ්‍රේණියට පත්වීමක් ලැබීමකින් තොරව ගුරු සේවයේ උසස්වීම සඳහා අංක 1885/38 හා 2014.10.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදන සපයා නොමැති බව මින් අවධාරණය කෙරේ.

3.23 ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස්වීම් වලදී නිකුත් කෙරෙන උසස්වීම් ලිපි වල, ඊළඟ ශ්‍රේණියට/ පන්තියට උසස්වීමට සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් හා සම්පූර්ණ කළ යුතු වෘත්තීය සමාලෝචන අවශ්‍යතාව පිළිබඳව විධිවිධාන ඇතුළත් කළ යුතුය.

3.24 නව සේවා ව්‍යවස්ථා විධිවිධාන 2008.07.01 දින සිට ක්‍රියාත්මක වීම මත ඊට අදාළ අන්තර්ග්‍රහණ වැටුප් සංශෝධනය අධ්‍යාපන චක්‍රලේඛ අංක 35/2014(I) හි විධිවිධාන යටතේ 2008.07.01 දින සිට ක්‍රියාත්මක කළ යුතුය. එහිදී අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය අන්තර්ග්‍රහණයෙන් පසුවද ක්‍රියාත්මක ලෙස සැලකිය යුතුය. අන්තර්ග්‍රහණයෙන් පසු උසස්වීමක දී, උසස්වීම් දිනය නව වැටුප් වර්ධක දිනය සේ සැලකිය යුතුය.

3.25 ගුරු සේවයේ උසස්වීම පිළිබඳ අන්තර්කාලීන විධිවිධාන 2019.10.23 දින දක්වා දීර්ඝ කිරීම මත 2019.10.22 දිනට උසස්වීම සඳහා වූ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කර ඇති ගුරුභවතුන්ට කාර්යක්ෂමතා කඩඉම් හා වෘත්තීය සමාලෝචන අවශ්‍යතාව නොසලකා උසස්වීම් ලබා දිය හැකි හෙයින් විදුහල්පතිවරුන් මඟින් ගුරුභවතුන් දැනුවත් කර උසස්වීම් අයදුම්පත් ඉදිරිපත් කිරීමට සලස්වා ගුරු සේවයේ උසස්වීම් අප්‍රමාදව ලබා දීමට ක්‍රියා කළ යුතුය.

3.26 ගුරු සේවයේ උසස්වීම් වලට අදාළ හිඟ වැටුප් ගෙවීමේ කටයුතු, උසස්වීම් ලිපි නිකුත් කළ වහාම අවසන් කිරීමට අදාළ අංශ ක්‍රියා කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන අතර, ඒ මඟින් හිඟ වැටුප් ගෙවීම ප්‍රමාද වීමෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේ දී උද්ගත වන ගැටලු මඟ හරවා ගැනීමට ද ඉඩ ලැබෙනු ඇත.

පද්මසිරි ජයමාන්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය